තලවාකැලේ - ලිඳුල නගර සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
---------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 31 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට තලවාකැලේ - ලිඳුල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 නොසැසඳුණු ගිණුම්
------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ශේෂ 03 ක වටිනාකම එම ගිණුම් ශේෂවලට අදාළ උපයෝගී ලේඛනවල ශේෂ සමග සැසඳීමේදී රු.397,324 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-------------------------------------

(අ). ලැබිය යුතු ගිණුම්
---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 01 සිට වසර 14 දක්වා කාල පරාසයකට අදාළ කර්මාන්ත ණයගැති ශේෂය රු.2,084,114 ක් විය.

(ආ). ගෙවිය යුතු ගිණුම්
----------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 02 සිට වසර 06 දක්වා කාල පරාසයකට අදාළ ගෙවිය යුතු ගිණුම් ශේෂ 05 ක ශේෂය රු.1,080,012 ක් විය.

1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම
--------------------------------------------------------

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම
-----------------------------------------------

වටිනාකම් තහවුරු කෙරෙන සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.10,151,824 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් සහ ජ'නල් සටහන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 අනුකූල නොවීම
-------------------
නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
---------------------------------------------------------------------------
2002 වර්ෂයේ සිට 2016 වර්ෂය අතර කාල පරිච්ඡේදය තුළ සභාවට ලැබී අගරු වී තිබුණු රු.517,900ක චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 189 හා 486 අනුව කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
------------------------
2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------
ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,777,807 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,486,470 ක් විය.

2.2 මූල්‍ය පාලනය
-----------------
(අ). සභාවේ ජංගම බැංකු ගිණුමක සමාලෝචිත වර්ෂයේ සෑම මාසයකම අවසානයේදී අවම වශයෙන් රු.6,500,000 ක මුදල් රඳවා තිබුණු අතර, එම මුදල සුදුසු ආකාරයකට ඵලදායී ලෙස උපයෝජනය කර හෝ ආයෝජනය කර හෝ නොතිබුණි.

(ආ). 2017 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශනයේ උපලබ්ධි නොවූ ලැබීම් ලෙසට 1993 වසරේ සිට ඉදිරියට ගෙන එන රු.410,726 ක ශේෂය නිරවුල් කර නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය
-----------------------
2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය
---------------------------------------
සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.4,808,551 ක් වූ වරිපනම් බදු, කඩකුලී, ගෙවල් කුලී සහ බිම්බදු හිඟයෙන් වර්ෂය අවසාන වනවිට රු.2,072,048 ක් පමණක් අයකර තිබුණු බැවින්, හිඟ ආදායම් අයකිරීම සතුටුදායක නොවීය.

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු
-------------------------------
පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.854,826 ක් හා ඉඩම් හුවමාරු කිරීමේ මුද්දර ගාස්තු රු.303,500ක් අයවිය යුතුව තිබුණි.

2.4 අධිභාර
---------
නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂයන් තුළ පැනවූ අධිභාරවලින් 2017 දෙසැම්බර් 31 දිනට රු.25,500 ක මුදලක් අයකර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 කාර්ය සාධනය
-------------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ). ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
----------------------------------

සභා බලප්‍රදේශයේ ජනතාවට කසළ කළමනාකරණය සඳහා බෙදාහැරීමට 2016 වර්ෂයේදී මිලදීගෙන තිබුණු කසළ බඳුන් 100 කින් රු.87,274 ක් වටිනා කසළ බඳුන් 23ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද බෙදාහැර නොතිබුණි.

(ආ). තිරසර සංවර්ධන ඉලක්ක
------------------------------

තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව නගර සභාව දැනුවත් වී නොතිබුණු අතර, ඒ සම්බන්ධයෙන් කිසිදු කාර්යයක් සමාලෝචිත වර්ෂය තුළ කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
-------------------------------------

(අ). සභාවට අයත් පොදු වෙළඳපොලේ බදුදී තිබුණු කඩ කාමර 20 ක බදු ගිවිසුම්වල සහ පුද්ගලයින් දෙදෙනෙකුට බදුදී තිබුණු ඉඩම් කැබලි 03 කට අදාළ බදු ගිවිසුම්වල වලංගු කාලය අවසන්ව පැවතියද, නව ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර නොතිබුණි.

(ආ). සභාවේ කඩ කාමර පෙර වර්ෂවල බදුදී තිබුණු බදුකරුවන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.294,896 ක හිඟ බදුකුලී අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගත් බව දන්වා තිබුණද, ඒ බව සනාථ කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ). සභාවට අයත් ගව ඝාතකාගාරයේ අපද්‍රව්‍ය විධිමත්ව බැහැර කිරීම සඳහා නිසි ප්‍රමිතියෙන් යුතු උරාගන්නා වලවල් ඉදිකර නොතිබුණු අතර, ඒ හේතුවෙන් ගව ඝාතකාගාරය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක්ද ලබාගැනීමට නොහැකිවී තිබුණි.

(ඈ). 2016 දෙසැම්බර් 31 දිනට සිදුකළ භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගෙන තිබුණු රු.111,556 ක් වටිනා පුස්තකාල පොත් 697 ක ඌනතාවය සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය
------------------------------------

(අ). සේවක පුරප්පාඩු
--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 09 ක පැවති පුරප්පාඩු 23 ක් සම්පූර්ණ කර නොතිබුණි.

(ආ). සේවක ණය

---------------

සභාවේ සේවය කර 2012 වර්ෂයේදී විශ්‍රාම ලැබූ සෞඛ්‍ය කම්කරුවකුගෙන් අයවිය යුතු රු.88,737 ක ණය මුදල සමාලෝචිත වර්ෂයේ අවසානය වනවිටද අයකර නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

(අ). පළාත් පාලන කොමසාරිස්ගේ 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන චක්‍රලේඛය අනුව වරිපනම් බදු සඳහා දේපල තක්සේරුව වසර 05 කට වරක්වත් සිදුකළ යුතු වුවද, 2011 වර්ෂයට පසු තක්සේරු කර නොතිබුණි.

(ආ). මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ 2016 මාර්තු 17 දිනැති අංක මප/ප.පා.කො/2016/03 දරන චක්‍රලේඛය අනුව කඩ කාමර කුලී වසර 05 කට වරක්වත් සංශෝධනය කළ යුතු වුවද සභාව සතු පොදු වෙළඳපොල පිහිටි කඩ කාමර 30 ක් සඳහා 2007 තක්සේරු කරන ලද කුලී සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටද සංශෝධනය කර නොතිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

-----------------------------

ඌන උපයෝජිත වත්කම්

------------------------------

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනයකර ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය සඳහා අත්කර ගන්නා ලද ඉඩමක 2015 වර්ෂයේදී ඉදිකර තිබුණු රු.1,752,818 ක් වටිනා මිඩ්ල්ටන් සංචාරක ගිමන්හල 2017 වර්ෂයේදී රු.216,000 කට බදුදී තිබුණද ඉඩමේ අයිතිය පිළිබඳ ගැටළුව හේතුවෙන් බදුකරු අඛණ්ඩව ව්‍යාපාරය පවත්වාගෙනගොස් නොතිබුණු අතර රු.52,696 ක් පමණක් අයවී තිබුණි.

3.6 නිෂ්ක්‍රීය වත්කම්

-------------------

(අ). 2014 වර්ෂයේදී පළාත් නැගුම වැඩසටහන යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝජනයකර ඉදිකර තිබුණු රු.2,174,909 ක් වටිනා මිඩ්ල්ටන් ආහාර අලෙවි මධ්‍යස්ථාන ගොඩනැගිල්ල කිසිදු කාර්යකට යොදා නොගෙන සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටද නිෂ්කාර්යව පැවතිණි.

(ආ). ඉහළ කොත්මලේ ජලාශය ආශ්‍රිතව බෝට්ටු සේවාවක් පවත්වාගෙන යාම සඳහා මධ්‍යම පළාත් සංචාරක අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝජනයකර 2013 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.761,900 ක් වටිනා මෝටර් බෝට්ටු එන්ජිමක්, ෆයිබර් මෝටර් බෝට්ටුවක් සහ ෆයිබර් පාගන බෝට්ටු 02 ක් නිෂ්කාර්යව සභා පරිශ්‍රයේ රඳවා තිබුණි.

(ඇ). පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනයකර සමාලෝචිත වර්ෂයේදී ඉදිකර තිබුණු රු.1,484,256 ක් වටිනා ප්‍රතිචක්‍රීයකරන ද්‍රව්‍ය මිලදී ගැනීමේ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල කිසිදු කාර්යයකට උපයෝජනය කර නොතිබුණි.

4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

-------------------------------------------

අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේදී ආදායම් විෂයයන් 05 ක සියයට 18 සිට සියයට 140 දක්වාද, වියදම් විෂයයන් 08 ක සියයට 11 සිට සියයට 184 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණ වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතරපහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| ආදායම් | හිඟ ආදායම් අයකර නොගැනීම |
| ණයගැති/ ණයහිමි | පැරණි ශේෂ නිරවුල් නොකිරීම |
| සේවක කළමනාකරණය | සේවක පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම |
| වත්කම් | ප්‍රශස්ත ලෙස උපයෝජනය නොකිරීම |